කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2018

11 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව I | කාලය: පැය එකයි.

නම: .................................................................... විභාග අංකය: ...........

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න**
- **අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා තිත් ඉර මත ලියන්න.**

1. සාමාන්‍ය පතනශිඝ්‍රතා නියමය .................................... ගෝලය තුළ ක්‍රියාත්මක වේ. ( පරිවර්ති / අපරිවර්ති / මෙසෝ )
2. පෘථිවියේ දේශගුණ ව්‍යාප්තිය පිළිබඳව මුල් ම අදහසක් ඉදිරිපත් කරනු ලැබුයේ .................................................... විසිනි. (ඔස්ටින් මිලර්, කෙපන්, ඇරිස්ටෝටල් )
3. ......................... ආග්නේය පාෂාණ වර්ගයකි. ( ජිප්සම් / මිනිරන් / ගැබ්රෝ)
4. වර්ෂ 2012 ජන සංගනණයට අනුව ශ්‍රී ලංකාවේ ජන ඝනත්වය ............කි. ( 233 / 332 / 323)
5. කඳුකර ප්‍රදේශවල පිහිටි උස් සම බිම් සානු නම්වේ. ඒ අතර වඩාත් ම උසින් ම පිහිටා ඇත්තේ ................................. සානුවයි. ( පාමීර්, ටිබෙට්, ඩෙකෑන්)
6. ජලය දූෂණය වරතමානයේ ලෝකය මුහුණ පා තිබෙන ප්‍රබල ගැටළුවකි. ජලය පිරිසිදු කොට නැවත ප්‍රයෝජනයට ගැනීම ...................................... නම්වේ. ( ප්‍රතිචක්‍රීයකරණය , ප්‍රභාසංශ්ලේෂණය, වාෂ්පීකරණය)
7. ආනයනික බොර තෙල් ..... ............................ තෙල් පිරිපහදුව මඟින් පිරිසිදු කරනු ලබයි. (කොළොන්නාව, සපුගස්කන්ද, නොරොච්චෝලේ)
8. කෘෂි අපනයන මණ්ඩලය පිහිටවනු ලැබුයේ ................................ වසරේ දී ය. (1972, 2010, 2014)
9. ලංකාවේ වැඩිම බිම් ප්‍රමාණයක වී වගා කරන දිස්ත්‍රික්කය ................................ වේ. (අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල)
10. මයික්‍රෝ මෝටර්රථ කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද්දේ 2001 වසරේ දීය. එහි ප්‍රධාන කර්මාන්ත ශාලාව ............................... පිහිටා ඇත. ( පොල්ගහවෙල, පෑලියගොඩ, හම්බන්තොට)

- **10-15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශනය කියවා බලා එය නිවැරදි නම් 'නි' වටාද, වැරදි නම් 'වැ' වටාද රවුමක් අඳින්න.**

11. ලෝකයේ ස්වභාවික රබර් නිෂ්පාදනයෙන් 95% සපයනු ලබන්නේ බ්‍රසීලයෙනි. නි / වැ
12. සූර්යය ශක්තිය, සුළං බලය, ජල විදුලිය , වැනි මූලාශ්‍රවලින් විදුලිය ලබා ගැනීමේදී පරිසර දූෂණයක් සිදු නොවේ. නි / වැ
13. මයෝසීන හුණුගල් තීරය ව්‍යාප්තව ඇත්තේ යාපන අර්ධද්වීපය ආශ්‍රිතවයි. නි / වැ
14. රටක ජන සංඛ්‍යාව අඩු හෝ වැඩි වීමට ජාත්‍යන්තර සංක්‍රමණ ද හේතු වේ. නි / වැ
15. ග්‍රාමීය රෝහල් වැඩි දියුණු කිරීම රටේ සෞඛ්‍යය ක්ෂේත්‍රයේ ප්‍රගතියට හේතු නොවේ. නි / වැ

- **16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්න වල ‘අ’ හා ‘ආ’ යනුවෙන් තීර දෙකක් දැක්වේ. ‘අ’ හා ‘ආ’ තීරු නිවැරදිව ගැලපූ විට පිළිතුරට හිමි අංකයකින් ඉර මත ලියන්න.**

16. ලොව ප්‍රධාන කඳුවැටි හතරක් ‘අ’ තීරුවේ ද ඒවා පිහිටි මහද්වීප ‘ආ’ තීරුවේ ද දැක්වේ. ‘අ’ සහ ‘ආ’ නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1.රොකී | A ඔස්ට්‍රේලියාව |
| 2.මහා බාධක කඳු | B ආසියා |
| 3. ඇට්ලස් | C උතුරු ඇමෙරිකාව |
| 4. යූරල් | D අප්‍රිකාව |

i. ACDB    ii. CABD    iii. CADB    iv. CDAB

17. ශ්‍රී ලංකාවේ වගා කරන ප්‍රධාන බෝග හතරක් ‘අ’ තීරුවේ ද ඒවා වැඩීමට වඩාත් ම සුදුසු පස ‘ආ’ තීරුවේ ද දැක්වේ. ‘අ’ සහ ‘ආ’ නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1. තේ | A ලවණ මිශ්‍ර වැලි පස |
| 2. රබර් | B දියළු පස |
| 3. පොල් | C ලොම් හා ලැටරයිට් පස |
| 4. වී | D කබොක් මිශ්‍ර පස |

i. ACDB    ii. CABD    iii. CADB    iv. CDAB

18. ප්‍රධාන ඛනිජ වර්ග හතරක් ‘අ’ තීරුවේ ද ඒවායේ ව්‍යාප්තිය ‘ආ’ තීරුවේ ද දැක්වේ. ‘අ’ සහ ‘ආ’ නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1. සර්කෝන් | A ඇළහැර |
| 2. රූටයිල් | B බලංගොඩ |
| 3. ඉල්මනයිට් | C පුල්මුඩේ |
| 4. මැණික් | D නිලාවේලි |

i. BCDA    ii. CABD    iii. BCAD    iv. CDAB

19. ලොව ප්‍රධාන කර්මාන්ත හතරක් ‘අ’ තීරුවේ ද ඒවායේ නිෂ්පාදන ‘ආ’ තීරුවේ ද දැක්වේ. ‘අ’ සහ ‘ආ’ නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1. පිඟන් මැටි ආශ්‍රිත කර්මාන්තය | A දුරස්ථ පාලක |
| 2. විද්‍යුත් කර්මාන්තය | B විසිතුරු භාණ්ඩ |
| 3. පෙට්‍රෝ රසායන කර්මාන්තය | C වියළි කෝෂ අමුද්‍රව්‍ය |
| 4. මිනිරන් කර්මාන්තය | D කෘතිම රබර් |

i. ACDB    ii. BADC    iii. CADB    iv. CDAB

20. ශ්‍රී ලංකාවේ වී වගා කරන කලාප ‘අ’ තීරුවේ ද ඒවාට ඇතුළත් දිස්ත්‍රික්ක අතුරින් එක බැගින් ‘ආ’ තීරුවේ ද දැක්වේ. ‘අ’ සහ ‘ආ’ නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1. වියළි කලාපය | A කෑගල්ල |
| 2. තෙත් කලාපය | B මොනරාගල |
| 3. අතරමැදි කලාපය | C නුවරඑළිය |
| 4. කඳුකර බිම් | D හම්බන්තොට |

i. ACDB    ii. CABD    iii. DABC    iv. DBAC

- **21-25 දක්වා ප්‍රශ්න වලට හිස් තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**


21. ශ්‍රී ලංකාව 1: 50,000 භූ ලක්ෂණ සිතියම් කොටස් ................ යුක්ත වේ.
22. පෘථිවි ශිලාගෝලය භූ තැටිවල එකතුවකින් නිර්මාණය වී ඇත. ඒ අතරින් ශ්‍රී ලංකාව පිහිටා තිබෙන්නේ ........................... භූ තැටියේ ය.
23. ස්වභාවිකව නිර්මාණය වන නියත රසායනික සංයුතියක් ඇති ස්ඵටික ස්වභාවයකින් යුතු අකාබනික සංඝටක ................ නම් වේ.
24. 1977න් පසුව ක්‍රියාත්මක වූ නිදහස් ආර්ථික ප්‍රතිපත්තිය අනුව කාර්මික ක්ෂේත්‍රය තුළ .............................. ව්‍යවසායකත්වය ප්‍රමුඛත්වයට පත් විය.
25. දිශාව දැක්වීමේදී තරු සලකුණකින් කෙළවර වන රේඛාවෙන් .................. උතුර දැක්වේ.




**26 -28 දක්වා ලංකා සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

26. ශ්‍රී ලංකාවේ සුළු පොල් ත්‍රිකෝණය ...................... අක්ෂරයෙන් දැක්වෙන දිස්ත්‍රික්කයට අයත් වේ.
27. ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතට අයත් ජනාධිකම දිස්ත්‍රික්කය ...................... අක්ෂරයෙන් දැක්වේ.
28. ලෝක උරුමයක් ලෙස නම් කර තිබෙන ආනවිලුන්දාව වගුරු බිම ...................... අක්ෂරයෙන් දැක්වේ.

- **29 – 30 ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමට දී ඇති වෘත්ත ප්‍රස්තාරය භාවිතා කරන්න.**




29. ලොව විද්‍යුත් උපකරණ නිෂ්පාදනයේ දී ප්‍රධාන වශයෙන් ම නිපදවනු ලබන උපකරණ වර්ගය නම් කරන්න. ..............................
30. විද්‍යුත් උපකරණ නිෂ්පාදන ප්‍රමාණය 7%ක් වන්නේ කුමන වර්ගයට අයත් උපකරණයන් ද? ......................................

- **31 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

31. පෘථිවිය එකිනෙකට සාපේක්ෂව ඉතා සෙමින් චලනය වෙමින් පවතින භූ තැටි රාශියකින් සමන්විත වන අතර ඒවා චලනය වන්නේ පහත සඳහන් කුමන හේතුව නිසා ද?
    i. උෂ්ණත්වය හේතුවෙනි. ii. සංවහනධාරා හේතුවෙනි
    ii. මුහුදු රළ හේතුවෙනි. Iv. ඉහත කිසිවකින් නොවේ.

32. අර්ධ වශයෙන් ගොඩබිම් වලින් වටවූ මුහුදු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    i. මධ්‍යධරණී මුහුද, රතු මුහුද, බෝල්ටික් මුහුද
    ii. මධ්‍යධරණී මුහුද, කැස්පියන් මුහුද, බෝල්ටික් මුහුද
    iii. අරාබි මුහුද, කැස්පියන් මුහුද, බෝල්ටික් මුහුද
    iv. චීන මුහුද, අරාබි මුහුද, රතු මුහුද

33. කිරිපට්ටි පාලනය දියුණු වීම කෙරෙහි බලපෑ සාධකයක් නොවන්නේ මින් කුමක් ද?
    i. නව තාක්ෂණික දැනුම භාවිතය
    ii. පුහුණු ශ්‍රමය තිබීම
    iii. සෞම්‍ය කලාපීය රටවල් පමණක් මෙම කර්මාන්තයේ යෙදීම
    iv. හොඳ තත්වයේ දෙනුන් බෝ කිරීම

34. පුනර්ජනනීය සම්පතක් නොවේ.
    i. වනාන්තර ii. පස iii. පොසිල ඉන්ධන iv. මත්සයින්

35. ජපානයේ වාහන නිෂ්පාදන මධ්‍යස්ථාන පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    i. ඔසාකා, කෝබේ, නගෝයා , දකුණු වේල්ස්
    ii. ඩෙට්රොයිට්, කෝබේ, නගෝයා , දකුණු වේල්ස්
    iii කෝබේ, නගෝයා , සෝල්, ෂන්ෂුවාං
    iv කෝබේ, නගෝයා , කියතෝ, ඔසාකා

36. කිවුල්දිය ධීවර කර්මාන්තය ලෙස හඳුන්වන්නේ,
    i. ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම ii. ගංගා ඇළ දොළවල මසුන් ඇල්ලීම
    iii.කලපු හා ගං මෝයවල මසුන් ඇල්ලීම iv. මහාද්වීප තටකයේ මසුන් ඇල්ලීම

37. වර්තමානයේ ලෝකයේ වැඩි අස්වැන්නක් ලබා දෙන බෝග වර්ග නිෂ්පාදනය කෙරේ. ඒ අතුරින් නොරින් 10 ලෙස හඳුන්වනු ලබන්නේ,
    i. වී වර්ගයකි. ii. තිරිඟු වර්ගයකි.
    iii. පළතුරු වර්ගයකි. iv. ඉරිඟු වර්ගයකි.

38. බලශක්තිය ලබා ගැනීමට ශ්‍රී ලංකාවේ විවිධ ශක්ති උත්පාදක භාවිතා කරයි. ඒ අතරින් ජෛව ස්කන්ධ ලෙස භාවිතාවන ද්‍රව්‍යයන් වන්නේ,
    i.දැව, කෘෂි අපද්‍රව්‍ය, සත්ව අපද්‍රව්‍ය, ජීව වායුව
    ii. දැව, කෘෂි අපද්‍රව්‍ය, බොර තෙල්, ජීව වායුව
    iii. ගල්අඟුරු, කෘෂි අපද්‍රව්‍ය, බොර තෙල්, පෙට්‍රෝලියම්
    iv. ගල්අඟුරු, බොර තෙල්, පෙට්‍රෝලියම්, ඩීසල්

39. වර්තමානයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති අධිවේගී මාර්ගය වනුයේ,
    i. කොළඹ - මාතර ii. කොළඹ - කටුනායක
    iii. මහනුවර - යාපනය iv. කොළඹ - මහනුවර

40. මුළු ලෝක ජනසංඛ්‍යාවෙන් 76% වාසය කරන්නේ,
    i. ආසියා හා යුරෝපා මහාද්වීපවල
    ii. ආසියා හා අප්‍රිකා මහාද්වීපවල
    iii. අප්‍රිකා හා යුරෝපා මහාද්වීපවල
    iv. ආසියා හා ඇමෙරිකා මහාද්වීපවල

කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2018

11ශ්‍රේණිය | භූගෝල විද්‍යාව II | කාලය: පැය දෙකයි.

නම: ................................................................ විභාග අංකය: ...........

- සැලකිය යුතුයි.
- මෙම ප්‍රශ්න පත්‍රය 1 සහ 11 වශයෙන් කොටස් දෙකකි.
- 1 කොටස අනිවාර්යය වේ. 11 කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුය

---

**1 කොටස**

**01) අ) ඔබ වෙත සපයා ඇති 1: 50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කොට ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

අංක 1 සිට 8 දක්වා ඇති ස්ථානවල භූ ලක්ෂණ තෝරා ලියන්න.

1. තුඩුව / දූපත
2. කලපුව / මෝය
3. ගං දහරය / වගුර
4. ඓතිහාසික ස්ථාන / බෞද්ධ සිද්ධස්ථාන
5. දිස්ත්‍රික්ක මායිම / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම
6. ගෙවතු / වෙනත් වගා
7. තණබිම් / හේන්
8. පොල් / රබර් (ලකුණු 04)

ii. ප්‍රදේශයේ නිරිතදිග භාගයේ පිහිටි පාලමේ සිට ඊට දකුණු දෙසින් ගඟ අසබඩ පිහිටි බෞද්ධ සිද්ධස්ථානය දක්වා ගංගාවේ දිග කොපමණ ද? (ලකුණු 02)

iii. සිතියම් ප්‍රදේශයේ තිබෙන ප්‍රධාන බෝග වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 01)

iv. සිතියම් ප්‍රදේශයේ අඩු සංවර්ධනයක් තිබෙන්නේ කුමන ප්‍රදේශයේ ද? (ලකුණු 01)

v. මෙම සිතියම් ප්‍රදේශය ආශ්‍රිතව දියුණු කළ හැකි කර්මාන්ත දෙකක් නම් කරන්න. (ලකුණු 02)

**ආ) මෙහි දැක්වෙන ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**



i. සිතියමේ දක්වා ඇති A, B, C අක්ෂර අතුරින් මෝටර් රථ නිෂ්පාදනය කරන ප්‍රධාන රටක් වන ජපානය දැක්වෙන අක්ෂරය තෝරන්න.


i. සිතියමේ දක්වා ඇති D, E, F අක්ෂර අතුරින් වගා කරන ප්‍රදේශයක් වන ආර්ජන්ටිනාව දැක්වෙන අක්ෂරය කුමක් ද?

ii. සිතියමේ G, H, I අක්ෂර අතුරින් වර්තමානයේ ලොව නැව් නිෂ්පාදනයේ ප්‍රමුඛයා වන දකුණු කොරියාව දැක්වෙන අක්ෂරය ලියන්න.

iii. සිතියමේ J, K, L අක්ෂර අතුරින් මරේඩාලිං නිම්නය දැක්වෙන අක්ෂරය කුමක් ද?

iv. සිතියමේ දැක්වෙන M, N, O අක්ෂර අතුරින් නවසීලන්තය දැක්වෙන අක්ෂරය ලියන්න. . (ලකුණු 05)

**ඉ)** **මෙහි ඇති ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**




i. සිතියමේ A,B,C අතුරින් තේ පර්යේෂණායතනය පිහිටි දිස්ත්‍රික්කය කුමක් ද?

ii. සිතියමේ D,E,F දැක්වෙන ගංගා වලින් වලවේ ගඟ දැක්වෙන අක්ෂරය කුමක් ද?


iii. සිතියමේ G,H,I වලින් දක්වා ඇති ස්ථාන අතරින් ආරුගම් බොක්ක දැක්වෙන අක්ෂරය කුමක් ද?

iv. සිතියමේ J,K,L අක්ෂර අතරින් පර්ල් මුතුපර දැක්වෙන අක්ෂරය කුමක් ද?

v. සිතියමේ M,N,O යන ස්ථාන අතරින් කිරල කැලේ දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 05)

# 11 කොටස

02) පෘථිවි ව්‍යුහය දැක්වෙන හරස්කඩක් යාබද රූපයේ ඇත.




i. රූප සටහනට අනුව 1 හා 3 අංකවලින් දක්වා ඇති ස්ථර නම් කරන්න. (ලකුණු 02)

ii. අංක 1 දරණ කොටසේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

iii. ජලයේ ගුණාත්මක භාවය අඩු කිරීමට හේතු වී ඇති මිනිස් ක්‍රියාකාරකම් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

03) i. ශ්‍රී ලංකාවේ තේ වගාව ආරම්භ කළ වතුයාය හා තේ හඳුන්වා දුන් පුද්ගලයා නම් කරන්න. (ලකුණු 02)

ii. තේ වගාව සාර්ථක වීම කෙරෙහි බලපාන සාධක තුනක් දක්වන්න. (ලකුණු 03)


iii. තේ වගාව දියුණු කිරීමෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට ලබා ගත හැකි ප්‍රයෝජන දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

04) i. ලෝකයේ ප්‍රධාන නිවර්තන වර්ෂා වනාන්තර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. නිවර්තන වර්ෂා වනාන්තර වල ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

iii. වනාන්තර හා වන ජීවීන් මුහුණපාන ගැටලු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)


05) i. ලෝක සිතියමේ ලකුණු කොට ඇති ජනාධික කලාප දෙක නම් කරන්න. (ලකුණු 02)



ii. අසම ජන ව්‍යාප්තිය කෙරෙහි බලපාන සාධක තුනක් දක්වන්න. (ලකුණු 03)

iii. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යුහය ආශ්‍රිතව දැකිය හැකි විශේෂ ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

06) ශ්‍රී ලංකාවේ ඛනිජ ව්‍යාප්තිය පහත සිතියමේ දැක්වේ.




I . මැණික් ලැබෙන ප්‍රදේශ දෙකක් 1 හා 2 අංකවලින් දක්වා ඇත. ඒවා නම් කරන්න. (ලකුණු 02)

ii. මැණික් වලින් ලබා ගන්නා ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න (ලකුණු 03)

iii. බලශක්ති සම්පත් සංරක්ෂණය කිරීමේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

07) i. සංවර්ධනය යන්න හඳුන්වන්න. (ලකුණු 02)

ii. සංවර්ධනය මනින නූතන මිනුම් තුනක් ලියන්න. (ලකුණු 03)

iii. ශ්‍රී ලංකාව මානව සම්පත් සංවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)